සියලුම හිමිකම් ඇවුරිණි [All Rights Reserved]

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය - 2020
## 12 ශ්‍රේණිය

## ව්‍යාපාර අධ්‍යයනය

කාලය පැය 2 යි.

**උපදෙස්**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.
- විභාග අංකය ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව ලියන්න.
- ප්‍රශ්න අංක 01 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු දෙක බැගින් හිමි වේ.

**විභාග අංකය ..............................**

පරීක්ෂක ගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංක | ලකුණු |
| 01-30 | |
| 31-50 | |
| එකතුව | |

01. ව්‍යාපාර සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

**A** ව්‍යාපාර යනු වෙළෙඳාම සහ වාණිජ්‍යයේ එකතුවයි.

**B** සුභ සාධන අරමුණින් පවත්වාගෙන යන සංවිධාන ව්‍යාපාර වශයෙන් පිළිගත නොහැකි ය.

**C** ව්‍යාපාර මිනිසාගේ පැවැත්මට සහ සංවර්ධනයට වැදගත් වේ.

**D** පුද්ගලයෙක් තම පාවිච්චි කළ මෝටර් රථය විකිණීම ව්‍යාපාර කටයුත්තක් නොවේ.

**E** සිය පාරිභෝගිකයන්ට භාණ්ඩ හා සේවා අලෙවිකරණ ආයතන ව්‍යාපාර ලෙස සැලකිය හැකි ය.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශ පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) A,B,C,D සහ E, (2) C,D, සහ E

(3) A,C,D, සහ E (4) B,E පමණි.

(5) B,C, සහ E පමණි. (.........)

02. ව්‍යාපාර කටයුතුවල විකාශනය,

(1) ස්වයං නිෂ්පාදනයත් සමඟ ඇති විය.

(2) භාණ්ඩ හුවමාරුවත් සමඟ ඇති විය .

(3) මුදල් භාවිතයත් සමඟ ඇති විය

(4) විශේෂිකරණයත් සමඟ ඇති විය .

(5) කාර්මික විප්ලවයත් සමඟ ඇති විය. (.........)

03. ව්‍යාපාර ගතිලක්ෂණ සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති පහත ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) අනාගතය අවිනිශ්චිත නිසාත්, ව්‍යාපාර පරිසරය නිරන්තරයෙන් වෙනස් වන නිසාත් සෑම ව්‍යාපාරයක් ම අවදානමකට මුහුණ දෙයි.

(2) හිග සම්පත් යොදාගෙන ඇති බැවින් නිවසේ සාමාජිකයන්ට ආහාර පිලියෙළ කිරීම ව්‍යාපාරික කටයුත්තකි.

(3) සෑම ව්‍යාපාරයක් ම එහි ප්‍රතිලාභයෙන් අභිප්‍රේරණය වීමක් දක්නට ලැබෙයි.

(4) අඛණ්ඩ පදනමකින් ව්‍යාපාර කටයුතු සිදු නොවන නිසා පුද්ගලයෙක් සිය පාවිච්චි කළ මෝටර් රථය අලෙවි කිරීම ව්‍යාපාර කටයුත්තක් ලෙස නොසැලකේ.

(5) සෑම ව්‍යාපාරයක් ම අන් අය සමඟ හුවමාරු කිරීම සඳහා කිසියම් නිෂ්පාදිතයක් ඉදිරිපත් කරයි.

**(……….)**

04. පහත X තීරුවේ ව්‍යාපාර පරිසර වර්ගීකරණයන් ද Y තීරුවේ ඊට අදාළ සාධක ද දැක්වේ.

| X | Y |
|---|---|
| 1.සාර්ව පරිසරය<br>2.අභ්‍යන්තර පරිසරය<br>3.ආසන්න පරිසරය | **A** අයිතිකරුවන්<br>**B** සැපයුම්කරුවන්<br>**C** නීති රීති පද්ධති<br>**D** ගෝලීයකරණය<br>**E** සංවිධාන සංස්කෘතිය<br>**F** ගනුදෙනුකරුවන් |

X තීරුව Y තීරුව සමඟ ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

(1) 1-A,E, 2-B,F 3-C,D

(2) 1-E,F, 2-A,B 3-C,D

(3) 1-F,B, 2-C,D 3-A,E

(4) 1-B,E, 2-A,D 3-C,F

(5) 1-C,D, 2-A,E, 3-B,F **(……….)**

05. තේ නිෂ්පාදන කර්මාන්තයේ නිරත ආයතනයකට අදාළ ව කරන ලද පරිසර විශ්ලේෂණයකින් අනාවරණය කරගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

1. තරුණ පරපුර තේ වතුවල වැඩ කිරීමට අකමැතතක් දැක්වීම.
2. බොහෝ තේ කර්මාන්තශාලා යල්පැනගිය යන්ත්‍රෝපකරණ භාවිතය.
3. රුපියල අවප්‍රමාණය වීම.
4. රාජ්‍ය අනුග්‍රහය ප්‍රමානවත් නොවීම.
5. කර්මාන්තය සම්බන්ධයෙන් සේවකයන්ගේ ආකල්ප සෘණාත්මක වීම.

ඉහත තත්ත්වයන් අතුරෙන් මෙම ව්‍යාපාරයට තර්ජන වශයෙන් පමණක් සැලකිය හැකි වන්නේ,

(1) 1,3 සහ 5 පමණි. (2) 1,4, පමණි.

(3) 1,2 පමණි. (4) 3,4 සහ 5 පමණි.

(5) 3 පමණි. **(……….)**

06. ආර්ථික තිරසර බව හා පරිසර තිරසර බව යන කොන්දේසි එකවර ඉටු වීම තුළින් නිර්මාණය වන්නේ,

(1) ජීවත් විය හැකි බව (2) තිරසර බව

(3) දැරිය හැකි බව (4) සමානාත්මතාවය

(5) ගෝලීයකරණය (……….)

07. පහත සඳහන් ආදායම් ප්‍රභව වලින් රජයට ඉහළම ආදායමක් ලබාදෙන ප්‍රභව ඇතුළත් වරණය තෝරන්න.

(1) වරිපනම් බදු, රඳවා ගැනීමේ බදු, වැට් බදු

(2) ආදායම් බදු, සමාගම් බදු, ප්‍රාග්ධන ලාභ බදු

(3) ජාතිය ගොඩනැගීමේ බදු, සෙස් බදු, දඩ මුදල්

(4) පිරිවැටුම් බදු, රඳවා ගැනීමේ බදු, අක්කර බදු

(5) නිෂ්පාදන බදු, වැට් බදු, තීරු බදු (……….)

08. හිඟ අයවැය ලේඛනයක් ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලයක් **නොවන්නේ**,

(1) රාජ්‍ය ණය ඉහල යාම. (2) සාමාන්‍ය මිල මට්ටම පහළ යාම.

(3) ආර්ථික වර්ධනය. (4) පෞද්ගලික අංශයේ ආයෝජන සීමා වීම.

(5) පොලී අනුපාතය ඉහල යාම. (….…..)

09. පහත **X** තීරුවේ පාරිභෝගික අයිතිවාසිකම් කිහිපයක් හා **Y** තීරුවේ එම අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් පවතින නීතිමය ප්‍රතිපාදන කිහිපයක් ද දැක්වේ.

| X | Y |
|---|---|
| **1.** තොරතුරු දැනගැනීම | A. සෑම විදුලි උපකරණයක් සඳහා ම මාස 6 ක වගකීමක් ලබා දිය යුතු වීම. |
| **2.** තෝරා ගැනීම | B. ඒකාධිකාරී තත්ත්වයන් සහ ආධිපත්‍ය තත්ත්වයන් පවත්වාගෙන යාම පාරිභෝගික අධිකාරී පනතට අනුව වරදකි. |
| **3.** ආරක්ෂාව සලසා ගැනීම | C. සෑම සිල්ලර වෙළෙඳසැලකම මිල දර්ශනයක් ප්‍රදර්ශනය අනිවාර්ය වේ. |
| **4.** වන්දි ලබා ගැනීම | D. මේ වසරේ සිට සියලුම ආනයනික වාහනවල වායු බැලූන පැවතීම අත්‍යාවශ්‍ය වේ. |

X සහ Y තීරු ගැලපූ විට නිවැරදි පිළිතුර,

(1) 1-A, 2-B, 3-C, 4-D

(2) 1-C, 2-B, 3-D, 4-A

(3) 1-D, 2-B, 3-A, 4-C

(4) 1-B, 2-D, 3-A, 4-C

(5) 1-D, 2-B, 3-C, 4-A (……….)

**10 සහ 11 ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීමට පහත තොරතුරු උපයෝගී කර ගන්න.**

- සංවිධානවල දැකිය හැකි ගුණාංග සහ නීතිමය ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A. අරමුණක් පැවතීම

B. හඳුනාගැනීමට නමක් පැවතීම

C. පුද්ගලයන් සිටීම

D. සංවිධාන ව්‍යුහයක් පැවතීම

E. අඛණ්ඩ පැවැත්ම

F. ලැබෙය තනිව භුක්ති විඳීම

G. නීතිමය පුද්ගලභාවයක් පැවතීම

H. සීමිත වගකීමක් පැවතීම

10. ඉහත කරුණු අතරින් විධිමත් සංවිධානයක පොදු ගුණාංග වශයෙන් සැලකෙන්නේ,

(1) **A,C ,D** (2) **A,B,D**

(3) **E,G,H** (4) **F,G,H**

(5) **C,D,G** **(……….)**

11. සීමා සහිත පොදු සමාගම් හා සීමා සහිත සමූපකාර සමිතිවලට පොදු නීතිමය ලක්ෂණ වන්නේ,

(1) **A,D ,E** (2) **A,B,C**

(3) **D,E,G** (4) **C,E,H**

(5) **E,G,H** **(……….)**

12. හවුල් ආඥා පනතේ 24 වන වගන්තියට අනුව හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් අදාළ වගන්තිය වන්නේ,

(1) හවුල්කරුවන් සමානව ප්‍රාග්ධනයට දායක වීම.

(2) සියලුම හවුල්කරුවන්ට සමානව වැටුප් ගෙවීම.

(3) ලාභාලාභ සමානව බෙදා ගැනීම.

(4) බහුතර කැමැත්ත මත නව හවුල්කරුවන් බඳවා ගැනීම.

(5) හවුල්කරුවන්ගේ ගැනිලි සඳහා 5% ක පොලියක් අය කිරීම. **(……….)**

13. සීමා සහිත සමාගමක් ලියාපදිංචි කිරීමට අවශ්‍ය කරන ලියවිල්ලක් නොවන්නේ,

(1) සාංගමික ව්‍යවස්ථාවලිය (2) අධ්‍යක්ෂවරුන් පිළිබඳ ප්‍රකාශය

(3) සමාගමේ නම පිළිබඳ ප්‍රකාශය (4) නියමිත ආකෘතියේ අයදුම්පත්‍රය

(5) සංස්ථා ප්‍රකාශය **(……....)**

14. වරලත් ව්‍යාපාර සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) වාරලත් ව්‍යාපාරයකට සම්බන්ධ ප්‍රධාන පාර්ශව වන්නේ වරලත් හිමියා සහ වරලත් ලාභියා වීම.

(2) වරලත් හිමියාගේ නමින් භාණ්ඩ නිපදවා අලෙවි කරන ව්‍යාපාර නිෂ්පාදන වරලත් ව්‍යාපාර වේ.

(3) සෑම වරලත් ව්‍යාපාරයකට ම නීතිමය පුද්ගලභාවක් පැවතීම.

(4) වරලත් ලාභියාට සිය විකුණුම් මත පුරස්කාරයක් වරලත් හිමියා වෙත ගෙවීමට සිදු වේ.

(5) ව්‍යාපාරය සම්බන්ධයෙන් පූර්ණ නිදහසක් වරලත් ලාභියාට හිමි නොවේ. **(……….)**

15. ව්‍යවසායකයින් **බිහි වීමට බලපාන ප්‍රධානත ම පුද්ගල ගුණාංග** දැක්වෙන වරණය තෝරන්න.

(1) නිර්මාණශීලීත්වය, ස්වධීන බව, දැක්ම

(2) අධිෂ්ඨානය, කැපවීම, ආත්මවිශ්වාසය

(3) ස්වාධීන බව, මනෝ විහිතිය, දූරදර්ශීබව

(4) පුද්ගල අභිමුඛබව, කැපවීම, මිත්‍රශීලී බව

(5) ආදර්ශ චරිත, කණ්ඩායම්, අවස්ථා (……….)

16. ව්‍යවසායකත්ව සංවර්ධනයට බලපාන සාධක සහ ඊට එරෙහිවන සාධක කිහිපයක් පහත දැක්වේ.

A මනෝ විහිතිය (Mindset)

B පරිකල්පනික චින්තනය (Imaginary thinking)

C ආදර්ශ චරිත (Role modle)

D අනුකරණය (Replication)

E අත්දැක්ම් (Experience)

F ගතානුගතිකබව (Being Tradition)

ඉහත දෑ අතුරෙන් ව්‍යවසායකත්ව සංවර්ධනයට එරෙහිවන සාධක පමණක් ඇතුලත් කාණ්ඩය තෝරන්න.

(1) A,D,F (2) B,C,E

(3) B,C,D (4) C,D,E

(5) D,E,F (……….)

17. බොහෝ කුඩා පරිමාන ව්‍යාපාර අසාර්ථක වීමට ප්‍රධනත ම හේතුව වන්නේ,

(1) මූල්‍යමය ගැටලු

(2) කළමනාකරණ දුර්වලතා

(3) වෙළෙඳපොළ තරඟකාරීත්වයට මුහුණ දීමට අපහසු වීම

(4) ව්‍යවසායකත්ව හැකියා අඩු වීම

(5) රාජ්‍ය අනුග්‍රහය ප්‍රමානවත් නොවීම (……….)

18. මුදලේ කාර්යයන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) විනිමය මාධ්‍යයක් වීම, පොදු පිළිගැනීම, විලම්බිත ගෙවීම් මාධ්‍යයක් වීම.

(2) වටිනාකමේ සන්නිධියක් වීම, අනුකරණය දුෂ්කර වීම, වටිනාකමේ මිණුම් දණ්ඩක් වීම.

(3) ගිණුම් ඒකකයක් වීම, හුවමාරු මාධ්‍යයක් වීම, වටිනාකමේ සන්නිධියක් වීම.

(4) පොදු පිළිගැනීම, කුඩා ඒකක වලට බෙදිය හැකි වීම, කල්පැවැත්ම,

(5) විලම්බිත ගෙවීම් මාධ්‍යයක් වීම, ගිණුම් ඒකකයක් වීම, පොදු පිළිගැනීම, (……….)

19. මහ ජනයාගෙන් ඉල්ලුම් තැන්පතු භාර ගැනීමට බලය ඇති ආයතන වර්ගය වන්නේ,

(1) සමූපකාර ග්‍රාමීය බැංකු

(2) ලියාපදිංචි මුදල් සමාගම්

(3) බලපත්‍රලාභී වාණිජ බැංකු

(4) බලපත්‍රලාභී විශේෂිත බැංකු

(5) ඒකක භාර ආයතන (……….)

20. පහත X තීරුවේ මුදල් වර්ග කිහිපයක් ද Y තීරුවේ එවාට නිදසුන් කිහිපයක් ද දැක්වේ.

| X | Y |
|---|---|
| **A**. නියෝග මුදල්<br>**B**. ආසන්න මුදල්<br>**C**. විද්‍යුත් මුදල් | **1** ණය කාඩ්පත්<br>**2** ඉතිරි කිරීමේ තැන්පතු<br>**3** මුදල් නෝට්ටු<br>**4** හර කාඩ්පත්<br>**5** භාණ්ඩාගාර බිල්පත්<br>**6** කාසි |

(1) A-3,6 B-1,4 C-2,5 (2) A-1,3 B- 3,4, C-5,6

(3) A-3,6 B-2,5 C-1,4 (2) A-2,6 B- 3,4, C-1,3

(1) A-1,4 B-2,5 C-3,6 (……….)

21. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන් හා නියෝජ්‍යායතන කිහිපයක් පහත දක්වේ.

A මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීම

B ශ්‍රී ලංකාවේ නිල විදේශ සංචිත කළමනාකරණය

C රාජ්‍ය ණය කළමනාකරණය

D විනිමය අනුපාතික ප්‍රතිපත්තිය මෙහෙයවීම

E ව්‍යවහාර මුදල් නිකුත් කිරීම හා බෙදා හැරීම

F විදේශ විනිමය පාලනය

ඉහත කාර්යයන් අතුරෙන් ප්‍රධාන කාර්යයන් පමණක් ඇතුළත් පිළිතුර තොරන්න.

(1) B,C,E,F පමණි. (2) A,C,D,E පමණි.

(3) B,D,E,F පමණි. (4) A,B,D,F පමණි.

(5) A,B,D,E පමණි. (……….)

22. පහත සඳහන් රේඛන අතරින් පැවරිය නොහැක්කේ කුමන රේඛනය අඩංගු චෙක්පත ද?

(1) 

(2) ගණුදෙනු කළ නොහැකියි

(3) ලංකා බැංකුව

(4) ආදායකයාගේ ගිණුමට පමණයි

(5) ලංකා බැංකුව/ ගණුදෙනු කළ නොහැකියි (……..)

23. රක්ෂණ අයිතිය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) පියෙකුට තම දරුවන් පිළිබඳව රක්ෂණ අයිතියක් ඇත.

(2) ඥාතීත්වය මත රක්ෂණ හිමිකමක් ඇති නොවේ.

(3) ණය හිමියෙකුට ණය ගැතියා සම්බන්ධයෙන් අසීමිත රක්ෂණ අයිතියක් ඇත.

(4) වැඩිමහල් සහෝදරයෙකුට බාල සහෝදරයන් රක්ෂණය කළ හැක.

(5) සේව්‍යයාට සේවකයන් රක්ෂණය කළ නොහැක. **(……….)**

24. පහත දක්වෙන්නේ රථවාහන සම්බන්ධ අවදානම් කිහිපයකි.

**A** දිරාපත් වීම

**B** හදිසි අනතුරු

**C** සොරකම් කිරීම

**D** වෙළෙඳපොළ අගය අඩු වීම

**E** විකිණීමෙන් සිදු වියහැකි අලාභය

**F** තෙවන පාර්ශවයට සිදු වන හානිය

ඉහත සඳහන් දේ අතුරෙන් රථවාහන රක්ෂණය යටතේ රක්ෂණය කළ හැකි අවදානම් අඩංගු කාණ්ඩය වනුනේ,

(1) **A,B,C** (2) **A,C,D** (3) **A,E,F** (4) **B,C,D** (5) **B,C,F** **(………..)**

25. ප්‍රවාහනයේ මූලිකාංගවලට අයත් දේවල් පමණක් දක්වෙන වරණය තෝරන්න.

(1) වාහන, ගුවන් පාලම්, ඉන්දන, බස්නැවතුම

(2) දුම්රිය, මාර්ග, උමං මාර්ග, ආරක්ෂාව

(3) නැව, මුහුද, ඉඩකඩ, වේගය

(4) ගුවන් යානය, ගුවන් තොටුපොළ, සුබෝපභෝගී පහසුකම්

(5) වේගය, ආරක්ෂාව, ධාරිතාවය, අඩු පිරිවැය **(……….)**

26. ලොව ප්‍රකට අන්තර්ජාල වෙළෙඳසැලක් වන්නේ,

(1) Google.com (2) Yahoo.com (3) daraz

(2) Amezon.com (5) Msn.com **(……….)**

27. ශ්‍රී ලංකාවට ආනයනය කරන භාණ්ඩ අතුරෙන් ආයෝජන භාණ්ඩ කාණ්ඩයට පමණක් ඇතුළත් භාණ්ඩ දැක්වෙන වරණය තෝරන්න.

(1) ගොඩනැගිලි උපකරණ, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ, ප්‍රවාහන උපකරණ

(2) ඉන්ධන, රෙදිපිළි උපාංග, පොහොර

(3) ප්‍රවාහන උපකරණ, රථ වාහන, රසායනික නිෂ්පාදිත

(4) පොහොර, ඇගළුම් උපකරණ, ගොඩනැගිලි උපකරණ

(5) පරිප්පු, කිරි නිෂ්පාදිත, සීනි හා රසකැවිලි නිෂ්පාදිත **(……….)**

28. දූෂ්‍ය නෞභාරපතක් නිකුත් කිරීමේ තත්ත්වයක් එළඹ තිබියදී පලුදු වූ තොගයේ අනාගත අවධානම භාර ගනිමින් පාරිශුද්ධ නෞභාරපතක් ලබා ගැනීම පිණිස අපනයනකරුවෙකු විසින් නැවේ කපිතාන් වෙත ඉදිරිපත් කරන ලියවිල්ල,

(1) හානි රක්ෂණ ලිපිය (2) අවලෝකනපත

(3) අපනයන සටහන්කරය (4) ණයවර ලිපිය

(5) හානි රක්ෂණ සහතිකය **(……….)**

29. කාර්යක්ෂමතාවය සහ සඵලදායීතාවය අතර සම්බන්ධය දක්වන සටහනක් පහත දැක්වේ.

| | | කරන්නේ කෙසේද? | |
|---|---|---|---|
| | | නිවැරදි ලෙස | වැරදි ලෙස |
| කළේ කුමක්ද? | නිවැරදි දේ | 1……………………… | 2……………………… |
| | වැරදි දේ | 3……………………… | 4……………………… |

ඉහත 1,2,3,4 යන හිස්තැන් වලට සුදුසු පිළිතුරු පිළිවෙලින් දැක්වෙන්නේ,

(1) 1.කාර්යක්ෂමයි - සඵලදායි 2. අකාර්යක්ෂමයි - සඵලදායි 3.කාර්යක්ෂමයි - සඵලදායි නොවේ 4.අකාර්යක්ෂමයි - සඵලදායි නොවේ

(2) 1.කාර්යක්ෂමයි - සඵලදායි, 2.කාර්යක්ෂමයි - සඵලදායි නොවේ, 3. අකාර්යක්ෂමයි - සඵලදායි අකාර්යක්ෂමයි - සඵලදායි නොවේ,

(3) 1. සඵලදායි - කාර්යක්ෂමයි 2.සඵලදායි - අකාර්යක්ෂමයි 3. සඵලදායි නොවේ - කාර්යක්ෂමයි 4. සඵලදායි නොවේ - අකාර්යක්ෂමයි

(4) 1. අකාර්යක්ෂමයි - සඵලදායි, 2. සඵලදායි නොවේ - කාර්යක්ෂමයි , 3. අකාර්යක්ෂමයි - සඵලදායි නොවේ, 4. කාර්යක්ෂමයි - සඵලදායි

(5) 1. කාර්යක්ෂමයි - සඵලදායි නොවේ, 2.අකාර්යක්ෂමයි - සඵලදායි නොවේ, 3. කාර්යක්ෂමයි - සඵලදායි, 4. අකාර්යක්ෂමයි - සඵලදායි, **(……….)**

30. පහත දැක්වෙන්නේ එක්තරා කළමනාකරුවෙකු විසින් ඉටුකරන ලද කාර්යයන් කිහිපයකි.

1. උත්සවයක් සඳහා පැමිණි අමුත්තන් පිළිගැනීම
2. අයවැය සම්පාදනය කිරීම
3. ආයතනයේ සේවකයන් පිළිබඳ තොරතුරු රැස් කිරීම
4. නීත්‍යානුකූල ලියවිල්ලකට අත්සන් කිරීම.
5. කොටස් හිමියන්ගේ රැස්වීමක් ඇමතීම.
6. අනුගාමිකයන් අභිප්‍රේරණය කිරීම

මේ අතරින් අන්තර් පුද්ගල භූමිකාවට අයත් වන්නේ,

(1) 1 සහ 6 (2) 2 සහ 5 (3) 3 සහ 5 (4) 4 සහ 6 (5) 1 සහ 5 **(……….)**

**අංක 31 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

31. අ) මිනිසා විසින් අනිවාර්යයෙන් ම සපුරාගත යුතු කායික මානසික තත්ත්ව 1………………………… ලෙස හැඳින්වෙන අතර ඊට නිදසුන් ලෙස 1……………………………………… 2………………………………………… දැක්විය හැකිය.

ආ) 1…………………………………… සහ 2………………………………… සේවාවල ලක්ෂණ දෙකක කි.

32. අ) පුද්ගල විශේෂීකරණයේ ප්‍රතිඵලයක් ලෙස ………………………………………… බිහි වූ අතර එහි ප්‍රතිඵලය වූයේ ………………………………………………… ඇති වීමයි.

ආ) තමාට අවශ්‍ය දේ තමා විසින් ම නිෂ්පාදනය කර ගැනීම ……………………………… වන අතර වෙළෙඳපොළ සඳහා නිෂ්පාදනය කිරීම ……………………………… නිෂ්පාදනය යි.

33. අ) පිස්කල් ප්‍රතිපත්තිය යනු රජයේ ………………………………………… සහ ……………………………… සම්බන්ධ ප්‍රතිපත්තිය යි.

ආ) රජයේ වියදම …………………………… සහ ……………………………. වශයෙන් ප්‍රධාන කොටස් දෙකකි.

34. අ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ප්‍රමිති ක්‍රියාත්මක කරන ආකාර ලෙස 1…………………………………… 2……………………………………………………… දැක්විය හැකි ය.

ආ) **ආරූඪ නාමයකින්** පවත්වාගෙන යන කේවල ස්වාමී ව්‍යාපාරයක් …………………………………… …………………………………… යටතේ …………………………………………………………… වෙත ලියාපදිංචි විය යුතුය.

35. අ) සීමා සහිත බළන්ගොඩ පෞද්ගලික සමාගම යනුවෙන් සමාගමක් ඇත. මෙම සමාගමේ උපරිම කොටස් කරුවන් සංඛ්‍යාව ……………. විය අතර අවම අධ්‍යක්ෂවරු සංඛ්‍යාව …………… විය යුතුය.

ආ) ආත්ම විශ්වාසය, කැපවීම ආදිය ව්‍යවසායකත්ව ……………………………… වන අතර සන්නිවේදනය, අන්තර්පුද්ගල හැකියා ආදිය ව්‍යවසායකත්ව …………………………………… වේ.

36. අ) සමාජ මෙහෙවරක් කිරීමේ අභිලාශයෙන් නව්‍යතා බිහි කිරීම ………………………………………… වන අතර ස්වභාවික පරිසරයට ධනාත්මක බලපෑමක් කිරීම සඳහා නව්‍යතා සම්පාදනය ……………………………………………………………………… වේ.

ආ) ව්‍යාපාරිකයා, ව්‍යාපාරය ……………… කටයුතු කරන අතර ව්‍යවසායකයා, ව්‍යාපාරය ………. කටයුතු කරයි.

37. අ) වාණිජ බැංකුවල මහ ජනයා සතු ඉල්ලුම් තැන්පතු ශේෂ ……………………………………… මුදල් ලෙසත් ඉතුරුම් හා කාලීන තැන්පතු ශේෂ මුදල් ……………………………… ලෙසත් හැඳින්වේ.

ආ) ජංගම ගිණුමේ මුදල් ප්‍රමාණය ඉක්මවා කිසියම් සීමාවක් දක්වා චෙක්පත් ලිවීමේ පහසුකම …………………………………… වේ.

38. අ) රක්ෂණ කර්මාන්තය  නියාමනය කිරීමේ බලය ………………………………………………………

ට පැවරී ඇති අතර සිල්ලර වෙළෙඳාම නියාමනය කිරීමේ බලය ……………………………………

…………………………………………………… ට පැවරී ඇත.

ආ) පණිවිඩයක් ලැබුණු පසු ලබන්නා ඊට දක්වන ප්‍රතික්‍රියාව ………………………………… වන අතර යවන්නාට දක්වන ප්‍රතිචාරය ……………………………………………… වේ.

39. අ) තාක්ෂණික කුසලතා ඉතා වැදගත් වනුයේ ……………………………………………………

කළමනාකරුවන්ට වන අතර ……………………… කුසලතා සියලුම මට්ටම්වල කළමනාකරුවන්ට එක සමානව වැදගත් වේ.

අ) පීටර් ඩ්‍රකර්ට (Peter Druker) අනුව නිවැරදි දේ කිරීම (Doing right things)

…………………………………………………………………………………………………… යි.

40. අ) තනතුරට අදාල නීතිමය තත්ත්වය තුළින් ලැබෙනුයේ ……………………………………  යි.

ආ) කාර්යසාධන ප්‍රමිති ඇතිකිරීම ක්‍රමවත් ………………………… ක්‍රියාවලියක පළමු පියවරයි.

**අංක 41 සිට 50 දක්වා ප්‍රශ්නවලට කෙටි හා නිශ්චිත පිළිතුරු ලියන්න.**

41. විද්‍යුත් වාණිජ්‍ය කටයුත්තක් සිදු විය හැකි ආකාර හතරක් නම් කරන්න.

1………………………………………  2………………………………………

3………………………………………  4………………………………………

42. ව්‍යාපාරවලින් ගනුදෙනුකරුවන්ට ඉදිරිපත් කරන නිෂ්පාදිත වර්ග හතරක් නම් කරන්න.

1………………………………………  2………………………………………

3………………………………………  4………………………………………

43. සමාජය වෙනුවෙන් ඉටු කළ යුතු සමාජ වගකීම්වලට නිදසුන් හතරක් ලියන්න.

1………………………………………  2………………………………………

3………………………………………  4………………………………………

44. හවුල් ව්‍යාපාරයක හවුල් ගිවිසුමක් ඇති විය හැකි ආකාර නම් කරන්න.

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

45. සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහා ප්‍රධාන කාරණා තුන සඳහන් කරන්න.

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

46. සමූපකාර ප්‍රතිපත්ති හතරක් ලියන්න.

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

47. සීමා සහිත පොදු සමාගමක සාමාන්‍ය කොටස් හිමියෙකුට ලාභාංශ වලට අමතරව ලැබෙන ප්‍රතිලාභ දෙකක් ලියන්න.

.................................................................................................................................

.................................................................................................................................

48. ණයපත්වලින් ගනුදෙනු කිරීමේ දී සම්බන්ධවන පාර්ශව කවරේද?

.................................................................................................................................

.................................................................................................................................

49. ව්‍යාපාර අරමුණුවල ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

1. ........................................... 2. ...........................................

3. ........................................... 4. ...........................................

50. පහත සඳහන් කෙටි යෙදුම්වලින් අදහස් වන දෙය ඉදිරියෙන් ලියන්න.

1. SDFR ..............................................................................................................

2. SLS ..............................................................................................................

3. CIF ..............................................................................................................

4. IMF ..............................................................................................................